# කම්කරු අමාත්‍යාංශය

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

## තනතුරු පුරප්පාඩු

කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධිත හා 2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත යටතේ ස්ථාපිත ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. වෘත්තිය සුරක්ෂිතතා නිළධාරි(II ශ්‍රේණිය) : තනතුරු 01

**1.1** පත්වීමේ ස්වභාවය

i. සේවා ගණය : කණිෂ්ඨ කළමණාකාර

ii. වැටුප් කේතය : JM 1 -1-2016

iii. වැටුප් පරිමාණය : රු.42,600-10x755-18x1,135-70,580(ක.සේ.චක්‍රලේඛ02/2016 අනුව)

1.2 තනතුරට පැවරෙන කාර්යයන්

i. සේවා ස්ථානයන් හි වෘත්තිය ස්වස්ථතා මට්ටම අධීක්ෂණය කිරිම සඳහා විමර්ශන කටයුතු සංවිධානය කිරිම.

ii. වෘත්තිය සුරක්ෂිතතා අංශයේ විද්‍යාගාර කටයුතු කළමනාකරණය, අධීක්ෂණය, විද්‍යාගාර උපකරණ වල නඩත්තු පිළිබඳ ඍජු වගකීම.

iii. සේවා ස්ථානයන්හි වෘත්තිය ස්වස්ථතා මට්ටම පවත්වා ගැනීම සඳහා නිරන්තර විමර්ශන කටයුතු කිරිම හා එම ස්ථානයන්ට අවශ්‍ය උපදෙස් ලබා දිම

iv. සේවා ස්ථානයන්හි ඇති අහිතකර සාධක ඇගයිම සඳහා සේවා පරිසරය මිනුම් කිරිම, විද්‍යාගාරයේ ඇති උපකරණ සහ ක්ෂේත්‍රයේ දි මිනුම් කරන ලද උපකරණ වල නඩත්තුව

v. කළමනාකරණ සහකාර (තාක්ෂණ) නිලධාරින් ක්ෂේත්‍රට අදාළව ඉටුකරන වෘත්තිය සුරක්ෂිතතා පිළිබඳ තාක්ෂණ රාජකාරි කටයුතු වැඩ පැවරීම හා අධීක්ෂණය

vi. ඉහළ කළමනාකාරීත්වය විසින් පවරනු ලබන වෙනත් රාජකාරි

1.3 බඳවා ගැනිමේ සුදුසුකම් :

1.3.1 අධ්‍යාපන

බාහිර අයදුම්කරුවන්

*අධ්‍යාපන සුදුසුකම්*

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක භෞතික විද්‍යාව ඇතුළත් විද්‍යාවේදී(දෙවන පෙල ඉහළ) උපාධියක් ලබා තිබිම හෝ භෞතික විද්‍යාව විෂය පිළිබඳ දෙවන පෙල පහළ විශේෂ උපාධියක් ලබා තිබිම.

සහ

ii. උපාධිය ලබා ගැනිමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජය විසින් පිළිගත් ආයතනයක ක්ෂේත්‍රට අදාලව වසර එකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිම.

1.3.2 *අතිරේඛ සුදුසුකම්*

ඉංග්‍රිසි භාෂාව හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම පිළිබඳ පිළිගත් ආයතනයකින් සහතිකයක් ඉදිරිපත් කිරිම

1.3.3 වයස

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

1.34. වෙනත්

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිම සඳහා මනා යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

1.4. බඳවා ගැනිමේ ක්‍රමවේදය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලැබේ.

## 02. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) : තනතුරු 02

2.1. පත්විමේ ස්වභාවය

i. සේවා ගණය : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)

ii. වැටුප් කේතය : MA 1 -1-2016 Grade iii

iii. වැටුප් පරිමාණය : රු.27,910-10x300-7x350-4 x495-20 x660-48,540

2.2. තනතුරට පැවරෙන කාර්යයන් :

i. ආයතනයේ විවිධ පාඨමාලා ආරම්භ කිරිම හා පවත්වා ගෙන යාමට සහය විම
ii. විවිධ ව්‍යාපෘති සම්බන්ධිකරණය
iii. විවිධ ව්‍යාපෘති වලට අවශ්‍ය සියලුම ලියකියවිලි සකස් කිරිම
iv. ආයතනයේ නිවාඩු වාර්තා, පාලන වාර්තා, වාර්ෂික වාර්තා ඇතුළු සියලු වාර්තාමය කටයුතු පාලන නිලධාරීන්ගේ සහය ඇතිව සකස් කිරිමට උදව් කිරිම.
v. ආයතනයේ ගිණුම් කටයුතු වලට සහාය විම
vi. ඉහළ කළමනාකාරීත්වය විසින් පවරනු ලබන වෙනත් රාජකාරි

2.3 බඳවා ගැනිමේ සුදුසුකම් :

2.3.1 අධ්‍යාපන

බාහිර අයදුම්කරුවන් :

*අධ්‍යාපන සුදුසුකම්*

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දි සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රිසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකදී විෂයන් 06 ක් සමත්ව තිබිම

සහ

ii. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දි අවම වශයෙන් විෂයන් 03 කින් සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර සමත්ව තිබිම.

2.3.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :

ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පිය සේවා ගණයන් හි පහත සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

i. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දි සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රිසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකදී විෂයන් 06 ක් සමත්ව තිබිම

සහ

ii. සේවයේ ස්ථිර පත්විම් දැරිය යුතු අතර එම පත්විම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය
නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්විමක යටත් පිරිසෙයින් අවුරුදු 05 අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

2.3.3 වයස : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

2.34. වෙනත් :

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිම සඳහා මනා යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

2.4. බඳවා ගැනිමේ ක්‍රමවේදය: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලැබේ.

සේවා නියුක්ත කරවිමේ කොන්දේසි:

පත්විම් ස්ථිරය .සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**බඳවා ගැනිමේ දි වැටුප :**

බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනිමේ දි අදාළ තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනිමේ දි පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තිරණය කරනු ලැබේ.

**අයදුම් කිරිමේ ක්‍රමං**

**ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත 2022.04.08 දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, අංක 97, ජාවත්ත පාර , කොළඹ 05 ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් යොමු කරන්න. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය.**

**අයදුම්පත බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.** අයදුම්පත් භාරගන්නා අවසාන් දිනයට පසු ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත් කැඳවිමේ අවසන් දිනය :**

තනතුරට පත් කිරිම සඳහා ඉල්ලුම් කිරිම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2022.04.08** දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

මෙම තනතුරු සඳහා බඳවා ගැනිම් සම්බන්ධයෙන් අවසාන තීරණය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පාලක මණ්ඩලය සතු වේ.


දුරකථන අංකය :- 011- 2585425 / 011 – 598672
විද්‍යුත් තැපැල :- info@niosh.gov.lk
වෙබ් අඩවිය :- www.niosh.gov.lk

**අධ්‍යක්ෂ ජනරාල්**
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය
අංක 97
ජාවත්ත පාර
කොළඹ 05


Source: Sent from mudara@niosh.gov.lk (2022.03.25)